# සාමාන්‍ය සමයේ දසසතරවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 28 : 10-22

"අහස දක්වා තබන ලද ඉණිමග දිගේ දෙවියන් වහන්සේගේ දූතයෝ නගිමින් ද බසිමින් ද සිටිනු ජාකොබ් දිටීය."

ජාකොබ් බෙයර්-ෂෙබායෙන් නික්ම හාරාන් බලා ගියේය. ඔහු එක්තරා ස්ථානයකට පැමිණ, ඉර බැස ගිය හෙයින් මුළු රාත්‍රියම එහි ගත කළේය. තවද ඔහු එතැනින් ගලක් රැගෙන එය මත හිස තබා ගෙන නිදන්නට විය. එවිට ඔහු සිහිනයක් දිටීය. පුදුමයකි! පොළොවෙහි තබන ලද ඉනිමඟකි. එහි මුදුන අහස දක්වා විය. මෙන්න, දෙවියන් වහන්සේගේ දූතයෝ එහි නගිමින් ද බසිමින් ද සිටියෝය. සමිඳාණන් වහන්සේ එයට ඉහළින් සිට, "මම වනාහි නුඹේ පියා වූ ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද වන සමිඳාණන් වහන්සේ වෙමි. නුඹ සැතපී සිටින දේශය මම නුඹටත් නුඹේ පෙළපතටත් දෙන්නෙමි. තවද නුඹේ පෙළපත පොළොවේ දූවිලි මෙන් වැඩි වී, උතුරු, දකුණු, බටහිර, නැගෙනහිර දිශාවල පැතිර යන්නේය. මිහිපිට සියලු ජාතීහු නුඹ හා නුඹේ පෙළපත මගින් තමන් ආශිර්වාද කර ගන්නෝය. මෙන්න මම ද නුඹ සමඟ සිටිමි. නුඹ යන සියලු තැන්හි මම නුඹ රැක බලාගෙන මෙම දේශයටම නුඹ නැවත ගෙනෙන්නෙමි. මන්ද මා නුඹට කී දේ ඉටු කරන තුරු මම නුඹ අත් නොහරින්නෙමි"යි වදාළ සේක. ජාකොබ් නින්දෙන් අවදිව, "සැබැවින් ම සමිඳාණන් වහන්සේ මෙම ස්ථානයෙහි වැඩ සිටින සේක. එහෙත් මම එය නොදැන සිටියෙමි"යි කීය. ඔහු බිය වී "මේ ස්ථානය කෙතෙරම් බියකරු ද? මෙය අනෙකක් නොව දෙවියන් වහන්සේගේ ගෘහයකි. මෙය ස්වර්ගයේ දොරටුව ය"යි පැවසීය.

ජාකොබ් අලුයම නැඟිට තම හිසට තැබූ ගල ගෙන සිහිවටනයක් කොට එය සිටුවා, එහි මුදුනේ තෙල් වත් කළේය. තවද ඔහු ඒ ස්ථානයට දෙවියන් වහන්සේගේ ගෘහය යන අර්ථය ඇති 'බෙතෙල්' යයි නම් කළේය. එහෙත් ඒ නගරයට ඊට කලින් තිබූ නම ලූස් ය. ඔහු භාරයක් ඔප්පු කරමින් "දෙවියන් වහන්සේ මා සමඟ වැඩ සිට, මෙසේ මා යන මඟ ආරක්ෂා කර, මට කන්නට ආහාර ද අඳින්නට වස්ත්‍ර ද දෙන සේක් නම්, අනතුරක් නොමැතිව මාගේ පියාගේ ගෘහයට මට ආපසු යන්න සලස්වන සේක් නම්. සමිඳාණන් වහන්සේ මාගේ දෙවියන් වන සේක. තවද සිහිවටනයක් මෙන් මා සිටවූ මේ ගල දෙවියන් වහන්සේගේ ගෘහය වන්නේය. ඔබ මට දෙන සියල්ලෙන් සැබැවින් ම මම ඔබට දසයෙන් කොටසක් දෙන්නෙමි" යි කීය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 91:1-4, 14-15

පිළිතුර: සමිඳුනි, ඔබ කෙරෙහි අපගේ විශ්වාසය තබන්නෙමු.

ගීය:

පරමෝත්තමයාණන්ගේ රැකවරණයෙහි වසන තැනැත්තේ සර්ව බලැති දෙවිඳුන්ගේ සරණෙහි සුරැකි වන්නේය. ඔහු සමිඳුන්ට මෙසේ පවසයි. "එතුමාණෝ මාගේ රැකවරණය ය. මාගේ බලකොටුව ය. මාගේ දෙවිඳාණෝ ය. මම එතුමන් කෙරෙහි මාගේ විශ්වාසය තබන්නෙමි."

එතුමාණෝ කපටින්ගේ මළපත් වලින් ද බියකරු ලෙඩ රෝගවලින් ද අප රැක ගන්න සේක. සිය පියාපත්වලින් ඔබ ආවරණය කරන සේක.

“ඔහු මට ප්‍රේම කරන්නේ නම්, මම ඔහුට විමුක්තිය දෙන්නෙමි. ඔහු මාගේ නාමය පිළිගන්නේ නම් මම ඔහු රැක ගන්නෙමි. ඔහු මට අයදින්නේ නම්, මම පිළිතුරු දෙන්නෙමි. දුකේදී ඔහු සමඟ සිට ඔහු මුදා මම ඔහුට ගරු කරන්නෙමි.”

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
උත්වහන්සේ මරණයේ බලය බිඳ දමා ජීවනයත් අමරණීය භාවයත් සුබ අස්න මගින් හෙළිකර වදාළ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ස්වාමිනී, ඔබවහන්සේගේ වචන ආත්මය ද ජීවනය ද වෙයි.
සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබවහන්සේ වෙතය.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 9: 18-26

"මාගේ දුව මේ දැන් මළා ය. එහෙත් ඔබ වැඩියොත් ඈ ජීවත් වේ."

ජේසුස් වහන්සේ සෙනඟට කතා කරමින් සිටියදී එක්තරා ප්‍රධානියෙක් අවුල් උන්වහන්සේ නැමඳ, "මාගේ දුව මේ දැන් මළාය. එහෙත් ඔබවහන්සේ අවුත් ඈ මත අත තැබුව මැනව. එවිට ඈ ජීවත් වනු ඇතැ"යි කීය. ජේසුස් වහන්සේ නැගිට ඔහු පසු පස්සේ ගිය සේක. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ ද එසේම කළහ.

එවිට දොළොස් වසක් මහ ලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රියක් උන්වහන්සේ පසු පස්සේ අවුත් උන්වහන්සේගේ සළුවේ දාවල්ලට අත තැබුවාය. එසේ කළේ 'උන්වහන්සේගේ සළුවට පමණවත් අත තැබුවහොත් මට සුවය ලැබෙනු ඇතැ'යි ඈ සිතාගත් බැවිනි. ජේසුස් වහන්සේ හැරී ඈ දැක, "දියණියනි, ධෛර්යය ගන්න. ඔබේ ශ්‍රද්ධාව ඔබ සුවපත් කළේ යැ"යි වදාළ සේක. ඒ ස්ත්‍රිය ඒ මොහොතේ පටන් සුවපත් වූවා ය.

ජේසුස් වහන්සේ ප්‍රධානියාගේ ගෙට ඇතුළු වී, නළාකාරයන් ද ඝෝෂා කරමින් සිටි සමූහයා ද දැක, "අහකට යන්න, දැරිය මැරී නැත. ඈ නිදන්නීය යැ"යි වදාළ සේක. එවිට ඔව්හු උන්වහන්සේට සරදම් කළහ. එහෙත්, සමූහයා පිට කරනු ලැබූ පසු උන්වහන්සේ ඇතුළු වී ඇගේ අත ඇල්ලූ සේක. දැරිය නැගිට්ටා ය. මේ සිද්ධිය පිළිබඳ පුවත මුළු රට පුරා පතළ විය.

සුවිශේෂ වාක්‍යය එසේය.